# සීමාසහිත බණ්ඩාරගම විවිධ සේවා සමුපකාර සමිතිය

## තනතුරු ඇබෑර්තු

සී/ස බණ්ඩාරගම විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති 102:05 111 ගණකාධිකාරි තනතුර සඳහා සුදුසුකම්ලත් දිස්ත්‍රික්කයේ වසර 02 ක ස්ථිර පදිංචිය සහිත බාහිර අයදුම්කරුවන්ගෙන් 2025.08.01 දින සිට 2025.08.15 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | වැ.ප.අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| ගණකාධිකාරි | 102:05 111 | 01 | 19804-320×10-380×10-450×10-520×5 = 33904 |

02. මෙම තනතුරු ස්ථිරය, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. බඳවා ගැනීමේ සුදුසුකම් :-

(අ) 104:08 වැටුප් පරිමානයේ ස්ථිර පොත් තබන්නා තනතුරේ වසර 08 ක් හෝ 103:07 වැටුප් පරිමානයේ පොත් තබන්නා තනතුරේ වසර 06 ක් හෝ 102:06 වැටුප් පරිමානයේ පොත් තබන්නා තනතුරේ වසර 03 ක හෝ 104:08 වැටුප් පරිමානයේ ගිණුම් කටයුතු පිළිබඳ තනතුරක වසර 10 ක හෝ 103:07 වැටුප් පරිමානයේ ගිණුම් කටයුතු පිළිබඳ තනතුරක වසර 08 ක සතුටුදායක සේවා පළපුරුදක් ලබා තිබීම.

හෝ

(ආ) ගණකාධිකරණය පිළිබඳ වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාවක් හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික සහිතක පත්‍ර පාඨමාලාව සමත්වීම හෝ සහ සමුපකාර සමිතියක ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(ඇ) ගණකාධිකරණ ශිල්පිය ආයතනයේ අවසාන සහතිකය ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකම් හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික සහතික පත්‍ර පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය සමත්ව තිබීම හෝ සහ පිළිගත් ආයතනයක ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණ මට්ටමේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. වයස් සීමාව - අවුරුදු :24-45

05. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ . පරීක්ෂණයක් මගින්

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර, බඳවා ගැනීමේ නිති රීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත අවලංගු කළ හැකිය.